# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# චිත්‍රකලාව
# 6 ශ්‍රේණිය



අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනි කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
සකුන්තලා ඉලුක්පිටිය - ගුරු උපදේශක

**සියලු හිමිකම් ඇවිරිණි**

## චිත්‍ර සංරචනය

- සෙනග පිරෙන ගමේ කඩේ
- ආගමික වතාවත්


ඉහතින් ඇති මාතෘකා වලට චිත්‍රයක් අදින්න.

රේඛා ,හැඩතල ,වර්ණ පිළිබඳව සැලකිල්ලට ගන්න .

**චිත්‍ර සංරචනය කිරීම සඳහා යම් අදහසක් ගැනීමට මෙවැනි සිතුවම් බලන්න . මාතෘකාවට අදාළ ලෙස අවස්ථා දක්වන්න .වර්ණ කරන අයුරු තලය භාවිතා කර ඇති අයුරු බලන්න .**









## ද්‍රව්‍ය සම්පිණ්ඩනය -

- සිලින්ඩරාකාර හැඩයක් හා ශාකමය කොටස් රේඛවෙන් ඇඳීම
- ස්වාභාවික හැඩගත් වස්තු රේඛාවෙන් ඇඳීම

ද්‍රව්‍ය ඇඳීමේ දී එළිය අඳුර දැක්වීමෙන් ත්‍රිමාන ලක්ෂණ මතුවේ.

සිලින්ඩරය වෘත්තාකාර මුහුණත් දෙකකින් හා වක්‍රාකාර පෘෂ්ඨයකින් යුතු හැඩයකි.

ක්‍රෝටන් අත්තක් ඇඳීමේ දී ක්‍රෝටන් කොළයක් හොඳින් අධ්‍යයනය කරන්න .






එහි වර්ණ පිළිබඳව අදහසක් ලබාගන්න .නාරටි විහිදී ගිය ආකාරය බලන්න.


ස්වාභාවික පරිසරයෙන් සොයාගත් වස්තු රේඛාවෙන් ඇඳීමේ ද අවට පරිසරය හොඳින් අධ්‍යයනය කරන්න .එහිදී දකින දේවල් පැන්සලෙන් අඳින්න.




















**සිලින්ඩරාකාර හැඩ ගැන අධ්‍යයනය කරන්න .**

සොබාදහමේදී හමුවන ස්වාභාවික දේවල් අධ්‍යයනය කරමින් රේඛාවෙන් ඇඳීමට හුරුවන්න.

















## ක්‍රිස්තියානි දේවස්ථානයක නිර්මාණ ලක්ෂණ


- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රිස්තු දහම ව්‍යාප්ත වූයේ 16 වන සියවසේදී ය.
- ක්‍රිස්තියානි දේවස්ථාන ඉදි කිරීම සඳහා පෘතුගීසීන් මුල් විය.
- ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන රෝමානු හා ගොතික් යන නිර්මාණ ශෛලි 2 අනුව නිර්මාණය කර ඇත.
- රෝමානු ක්‍රමයේ දේවස්ථාන බොකු වහල හා රවුම් ආරුක්කුවලින් සමන්විත වේ. මෙම දේවස්ථානවල ප්‍රධාන දොරටුවට ඉහළින් අලංකාර වීදුරුවලින් නිමවා ඇති වෘත්තාකාර කවුළුවකි. එය Rose window ලෙස හැඳින්වේ.
- ගොතික් ක්‍රමයේ දේවස්ථාන තුඩු සහිත ආරුක්කුවලින් හා දෙපසට දළ බැවුම් ඇති වහල සහිතව නිර්මාණය කර ඇත. මෙම දේවාස්ථානවල තුඩු සහිත කවුළු රංජිත වීදුරුවලින් අලංකාර කර ඇත.
- රංජිත වීදුරු නිර්මාණවල ක්‍රිස්තියානි ආගමට අයත් විවිධ අවස්ථා හා චරිත නිරූපණය කර ඇත.
- දේවස්ථානයක බිම් සැලැස්ම කුරුසික හැඩය ගන්නා අතර එය අල්තාරය, කාමර, දිග් ශාලාව, කුලුනු, බයිබලය කියවන ස්ථානය හා පිවිසුම් දොරටුව යන අංගවලින් සමන්විත වේ.
- දිග් ශාලාවේ එක් කොනක 'අල්තාරය' හෙවත් 'පූජාසනය' අලංකාර වැටක් සහිත ව නිමකොට ඇති අතර ඒ පිටුපස බිත්තියේ බොහෝ විට චිත්‍රයෙන්, කැටයමින් හෝ රංජිත වීදුරුවලින් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතු දේවස්ථාන කිහිපයක් පහත දක්වේ.

  බොරැල්ලේ - සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය
  කොළඹ - ලන්දේසි පල්ලිය
  ගාල්ල - බලකොටුව තුළ පිහිටි කිතු දේවස්ථානය


### කිතු දේවස්ථානයක බිම් සැලැස්ම




1. අල්තාරය
2. කාමර
3. දිග් ශාලාව
4. ස්තම්භ(කුලුනු)
5. බයිබලය කියවන ස්ථානය
6. පිවිසුම් දොරටුව




රෝමන් ක්‍රමයේ දේවස්ථානය
කුරුසිය
වෘත්තාකාර කවුළුව (Rose window)
බොකු වහල සහිත
ආරුක්කුව (Round arch)





ගොතික් ක්‍රමයේ දේවස්ථානය
කුරුසිය
දළ බෑවුම් සහිත වහල
උල් වූ තුඩු සහිත ආරුක්කු
(Pointed arch)






රෝමන් ක්‍රමයේ දේවස්ථානයක ආරුක්කුවක්



-ප්‍රධාන දොරටුවට ඉහළින් අලංකාර
වීදුරුවලින් නිමවා ඇති වෘත්තාකාර කවුලු



රෝමන් ක්‍රමයේ දේවස්ථානයක



බොරැල්ල සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය

# නත්තල් උත්සවය හා බැදි නිර්මාණ

- "නතාල" නැමති පෘතුගීසි වචනයෙන් බිඳී ආ නත්තල යන වචනයෙන් " උපත" යන අර්ථය ලබා දේ.
- ලතින් භාෂාවෙන් ද "නතාලිස්" යන්නෙහි අර්ථය "උපත " වේ.
- ලෝකය පුරා විසිරී සිටින ක්‍රිස්තියානි බැතිමත්හු ජේසු බිළිදාගේ උපන් දින නත්තල ලෙසින් උත්සවාකාරයෙන් සමරති.
- ජේසුස් වහන්සේ යනු මනුෂ්‍යත්වය ලබාගත් දේව පුත්‍රයා වේ.
- නත්තල් උත්සවයේදී සමරනු ලබන්නේ ජේසුස් වහනසේගේ මෙම මනුෂ්‍යයකු ලෙස ඉපදීමයි.
- ජේසුස් වහන්සේ සාමයේ කුමාරයාණන් ලෙස සලකනු ලැබේ.
- ජේසුතුමාගේ මව මරියතුමිය වන අතර උන්වහන්සේ සුරැකි පියා ජුසේතුමාණන් වේ.
- දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ජේසු කුමරුන් උපන් බවට පිළිගැනේ.
- ජන සංගණනයකට සහභාගි වීම සඳහා "බෙත්ලෙහෙමට" පැමිණි අවස්ථාවේ ගවලෙනක් තුළ දී ජේසු බිළිදාගේ උත්පත්තිය සිදු වූ බව පිළිගැනේ.
- ක්‍රිස්තුස් වහන්සේ විසින් සිදුකරනු ලැබූ දේශනා හා උන්වහන්සේගේ ප්‍රාතිහාර්යයක් ද සබත් දිනය නීති රීති කැඩීම හේතුකොටගෙන ජුදා නායකයින් උන්වහන්සේට විරුද්ධව නැගී සිටියෝ ය.
- එම හේතූන් මූලකොටගෙන උන්වහන්සේ කුරුසියේ එල්ලා මරා දැමූහ.
- සැම වසරකම දෙසැම්බර් මස 24 වන දින මධ්‍යම රාත්‍රියේ ද දේවස්ථානයට රැස්වන කිතුනු බැතිමත්හු නත්තල හෙවත් ජේසු උපත උත්සවාකාරයෙන් පවත්වයි.
- එදින දුගී ජනතාවට ආහාරපාන, ඇඳුම් පැලඳුම් දීම මෙන් ම තෑගි බෝග බෙදා දීම ද සිදු කරනු ලබයි.
- කිතුනු බැතිමත්හු නත්තලට දින ගණනාවකට පෙර එම මංගල්‍යයට සැරසෙන අතර දේවස්ථානය හා නිවෙස් සැරසීම, ගවලෙන් සෑදීම හා නත්තල් ගස් අලංකරණය කිරීම ආදිය සිදුකරනු ලබති.
- එදින අලුත් ඇඳුම් පැලඳුම්වලින් සැරසීම මෙන් ම ප්‍රනීත ආහාරපාන පිළියෙල කිරීම ද ඔවුන්ගේ චාරිත්‍රයක් වේ.
- නත්තල් සුබපැතුම්පත් හුවමාරු කර ගැනීම විශේෂ සිද්ධියක්වන අතර නත්තල් සීයා කුඩා දරුවන්ගේ ප්‍රියජනක බලාපොරොත්තුවක් වේ.
- නත්තල් කැරොල් ගී, නත්තල් නාට්‍ය හා නත්තල ආශ්‍රිත චිත්‍රපට දර්ශන මෙම උත්සව කාලයේ දක්නට ලැබෙන විශේෂාංග වෙයි.
- දුප්පතුන් සඳහා දාන මාන දීම මෙන් ම කුඩා දරුවන් වෙනුවෙන් තෑගි බෝග හා ඇඳුම් පැලඳුම් බෙදා දීම ද නත්තල් දිනයේ දී පවත්නා සුවිශේෂ චාරිත්‍ර වේ.
- ජේසුස් වහන්සේගේ සාමයේ පණිවුඩය ලෝකවාසී සියලු දෙනා විසින් අගය කළ යුතු බව පිළිගැනීමට ලක් වෙයි.

1. නත්තල් උත්සවය සමරන ආගමික ජන කොටස හා මාසය නම් කරන්න.
2. නත්තල් උත්සවය හා බැඳුණු සැරසිලි අංග 4 ක් නම් කරන්න.
3. නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණ කුමක් ද ?
4. මෙම උත්සව කාලය තුළ සිදුවන යහපත් ක්‍රියා දෙකක් නම් කරන්න.
5. නත්තල් සැරසිලි සඳහා භාවිතවන අමුද්‍රව්‍ය 05ක් නම් කරන්න.
6. නත්තල් පතකට සුදුසු නිර්මාණයක් චිත්‍රණය කරන්න.



පහත සඳහන් ක්‍රියාකාරකම් කරන්න .

1.රෝමන් ක්‍රමයේ දේවස්ථානයක රූප සටහනක් ඇද,එහි කොටස් නම් කරන්න .

2..ගොතික් ක්‍රමයේ දේවස්ථානයක් ඇද ,කොටස් නම් කරන්න .


4. දේවස්ථානයක බිම් සැලැස්මක් ඇද එහි කොටස් නම් කරන්න .

4.ශ්‍රී ලාංකාවේ දේවස්ථාන කිහිපයක් හා ඒවා පිහිටි ප්‍රදේශ ඇතුළත් වගුවක් පිළියෙල කරන්න .

## පාරිභාරික භාණ්ඩයක් සඳහා මෝස්තර නිර්මාණය

අප පරිහරණයට  ගන්නා භාණ්ඩ පාරිභාරික භාණ්ඩ වේ .


ඒවායේ ඇති මෝස්තර අධ්‍යයනය කළ විට විවිධ ආකාරයේ මෝස්තර දැකගත හැකිය .





මූලික හා ද්විතීයික වර්ණ භාවිතයෙන් අලංකාර නිර්මාණයක් කිරීම .

මේ සඳහා වර්ණ පිළිබඳව අදහසක් තිබිය යුතුය .

මූලික වර්ණ දෙකක් එකතු වීමෙන් ද්විතීයික වර්ණයක් සෑදෙන බව ඉහතින් දක්වා ඇති සටහන් වලින් අවබෝධ කර ගන්න .මේවා සැලකිල්ලට ගෙන විසිතුරු මල් බඳුනක් සැරසිලි කරන්න .මල් බඳුනට මල් ඉත්තක් ද සාදන්න .විවිධ ආකාරයේ මෝස්තර හා හැඩ යොදාගන්න .









විවිධ ආකාරයේ හැඩ යොදාගන්න .

## ග්‍රැපික් චිත්‍ර

- ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් සකස් කිරීම


සිදුරු තහඩු මුද්‍රණය මගින් එම නිර්මාණය කරන අයුරු  දැනගත යුතුය .
මෙය එක් සරළ මුද්‍රණ ක්‍රමයකි.

යම් හැඩතලයක් ,සංකේතයක්, අක්ෂරයක් මේ සඳහා භාවිතා කළ හැකිය .
අවශ්‍ය දේ කපා ඉවත් කර සිදුරු තහඩුවක් සාදා ගන්න . සනකම් කාඩ්බෝර්ඩ් කැබැල්ලක් මේ සඳහා යොදා ගත හැකිය.

ඒතුළින් වර්ණ තවරා (ස්පොන්ච් එකක් ආධාරයෙන් )අවශ්‍ය නිර්මාණය සිදු කරන්න .මෙය stencil මුද්‍රණය  ලෙස හැදින්වේ . උදාහරණ  කීපයක් පහතින් දක්වා ඇත .







මෙම ක්‍රමයේ සංවර්ධනය වූ අවස්ථාවක් ලෙස Screen printing ක්‍රමය හැඳින්විය හැකිය .එවැනි මෝස්තරයක් සාදාගන්නා ආකාරය පහත දැක්වෙන රූපයෙන් දැක්වේ .පිටපත් විශාල සංඛ්‍යාවක් ලබා ගත හැකි ක්‍රමයකි .



සත්ව රූප ආශ්‍රයෙන් stencil මුද්‍රණය නිර්මාණ කිහිපයක් කරන්න. යොදා ගන්නා වර්ණ අනුව ඕනෑම මතුපිටක් අලංකරණය කල හැකිය.